

සවියෙන් පෙරට - අපි එකට
e-ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

11 ශ්‍රේණිය:ඉතිහාසය- 1 වාරය

# 2 පාඩම:ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය
## I කොටස-ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

සැකසුම - අජිතා පුෂ්පකාන්ති - ගුරු[1] උපදේශක
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
බුලත්සිංහල

# බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීම

පෘතුග්‍රීසීන් හා ලන්දේසීන් ආසියාවේ වෙළෙඳ කටයුතු වලින් ලබන විශාල ලාභය දුටු ඉංග්‍රීසීන් ආසියාව කෙරෙහි තම අවධානය යොමු කිරීම

ක්‍රි ව 1600 දී පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවා ආසියාවේ වෙළෙඳ කටයුතු වල නිරත වීමට රාජකීය අවසර පත්‍රයක් ලබා ගැනීම

පළමුවන නැව් කණ්ඩායම සුමාත්‍රා දූපත් වල වෙළෙඳ කටයුතු ආරම්භ කිරීම

විලියම් හෝකින්ස් යටතේ නැව් කණ්ඩායමක් ඉන්දියාවට පැමිණ එවකට මූගල් අධිරාජයා වූ ජහන්ගීර් සමග සාකච්ඡා පැවැත්වීම

# බ්‍රිතාන්‍යයන් ආසියාවේ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම

- ඉංග්‍රීසීන් ආසියාවට පැමිණි මුල් කාලයේ අග්නිදිග ආසියානු කලාපයේ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම
- අග්නිදිග ආසියාවේ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීමේදී ඉංග්‍රීසීන් පෘතුගීසීන්ට එරෙහිව ලන්දේසීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- ලන්දේසි සහය ඉංග්‍රීසීන්ට ලබා දුන්නද අග්නිදිග ආසියානු කලාපයේ වෙළෙඳ බලය ඉංග්‍රීසීන් සතුවනු දැකීමට ලන්දේසීන් අකමැති වීම

# බ්‍රිතාන්‍යයන් ආසියාවේ වෙළද සබඳතා ගොඩනගා ගැනීම

- ක්‍රි.ව. 1623 දී ඇම්බොයිනා දූපතේ ඉංග්‍රීසි බලකොටුවකට ලන්දේසීහු පහර දුන්නද ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට ඉංග්‍රීසි බලය ශක්තිමත් නොවූ හෙයින් අග්නිදිග ආසියානු ප්‍රදේශ වලින් ඉවත්වූ ඉංග්‍රීසීන් ඉන්දියාව කෙරෙහි අවධානය යොමු කිරීම

- ක්‍රි.ව. 1607 වන විට ඉංග්‍රීසීන් ඉන්දියාවේ වෙළෙද බලය ගොඩනගා ගත් අතර ප්‍රදේශ කිහිපයක වෙළෙද මධ්‍යස්ථාන පිහිටුවීම
    - මද්‍රාසිය
    - බොම්බාය
    - කල්කටා

- ක්‍රි.ව. 1664 වන විට ප්‍රංශවරුන්ද ඉන්දියාවේ වෙළෙද මධ්‍යස්ථාන කිහිපයක් පිහිටු වීම
    - පොන්ඩිචෙරි
    - කරිකාල්
    - චන්ද්‍රනගර්

# ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීම






ඒ සඳහා බලපෑ හේතු දෙකකි

* ශ්‍රී ලංකාවේ පිහිටීම

*ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුළු වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගත හැකි වීම

# ඉංග්‍රීසීන් හා උඩරට රාජ්‍ය අතර දූත සබදතා

- ක්‍රි. ව. 1762 දී ජෝන් පයිබස් උඩරටට පැමිණීම
- ක්‍රි. ව. 1782 දී හියු බොයිඩ් උඩරටට පැමිණීම
- 1795 දී රොබට් ඇන්ඩෲස් උඩරටට පැමිණීම

# බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම

## ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ වල බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම

ප්‍රංශ ආක්‍රමණය නිසා බ්‍රිතාන්‍ය රැකවරණය ලබා සිටි ඕලන්ද පාලකයා වූ පස්වන විලියම් රජුගෙන් තමාට වාසි දායක ලිපියක් මෙරට ලන්දේසි ආණ්ඩුකාරවරයා වෙත එවීමට කටයුතු කිරීම

ක්‍රි .ව. 1795 දී මෙරට ලන්දේසි ආණ්ඩුකාර ෆන් එංගල්බෙක් වෙත ඒවූ මේ ලිපිය කිව් ලිපිය වේ

කිව් ලිපියට අනුව ආණ්ඩුකාරවරයා කටයුතු නොකළ නිසා ඉංග්‍රීසීන් ලන්දේසීන් සතු ත්‍රීකුණාමලය ඇතුළු බලකොටු වලට පහර දී තමන් සතු කරගැනීම

# ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය

- ක්‍රි. ව. 1796 – 1798 දක්වා පැවති මෙම පාලනය මද්‍රාසි පාලනය වේ
- මුහුදුබඩ පුදේශ වල පාලනයට රෙසිඩන්ට් වරයෙකු පත් කළ අතර කලෙක්ටර් වරුන්ගේ අධීක්ෂණය යටතේ අවුමිල්දාර්වරු සහ තවත් නිලධාරීන් ආදායම් එකතු කිරීමේ කටයුතු වල නිරත වීම
- මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමේදී වෙළෙඳ සමාගමට විශාල මුදලක් වැය වීම නිසා ඉතා ඉක්මනින් හැකි තරම් ලාභ ලබා ගැනීමේ අරමුණින් කටයුතු කිරීම
- පොල් ගස් බද්ද වැනි නව බදු පැනවීම

# ක්‍රි. ව. 1797 ඉංග්‍රීසි වෙළෙඳ සමාගමට එරෙහි අරගලය

ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ පාලනය කෙරෙහි වෙරළබඩ ජනතාව තුළ තිබූ නොසන්සුන්තාව හා අප්‍රසාදය කෙටි කලකින් කැරැල්ලක් බවට පත් වීම

# ද මියුරන් කොමිසම

මෙරට මුහුදුබඩ ප්‍රදේශ වල තත්වය සොයා බලා අවශ්‍ය ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීමට පැවති කොමිසමයි

## කොමිසමේ නිර්දේශ

- ✓ මදුරාසි නිළධාරීන් ( අවුමිල්දාර් වරු) ආපසු යවා දේශීය නිළධාරීන් පත් කිරීම
- ✓ පොල් ගස් බද්ද ඇතුලු නව බදු ඉවත් කිරීම
- ✓ ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටු වීම

# ද්විත්ව පාලනය ( ක්‍රි ව1798 – 1802 )

- ක්‍රි. ව. 1798 වසරේ සිට මෙරට මුහුදුබඩ ප්‍රදේශ වල ඉංග්‍රීසි පාලනයේ වෙනසක් සිදු වීම
- පරිපාලන ක්‍රමය තුළ හා දේශපාලන කටයුතු මෙහෙය වීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව  ආණ්ඩුකාරවරයෙකු පත් කළ අතර  ආදායම් එකතු කිරීම ඇතුලු කටයුතු වෙළඳ සමාගමට පැවරීම
- මෙසේ බ්‍රිතාන්‍ය රජය හා වෙළෙඳ සමාගම එක්ව මෙරට වෙරළබඩ ප්‍රදේශ පාලනය කිරීම ද්විත්ව පාලනය නම් වේ

# මෙරට වෙරළබඩ ප්‍රදේශ කිරීටයේ පාලනයට නතු වීම

බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාට වෙළෙඳ සමාගමේ නිලධාරීන්ගෙන් සහයෝගයක් නොලැබීම නිසා ද්විත්ව පාලනය අසාර්ථක වීම

ක්‍රි ව 1802 සිට මෙරට වෙරළබඩ ප්‍රදේශ වල පාලනය මුලුමනින්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට පත් කෙරිණි

# ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය යටත් කර ගැනීම



ඉංග්‍රීසීන් උඩරටට එල්ල කළ ආක්‍රමණ

- ✓ ක්‍රි ව 1803 ආක්‍රමණය
- ✓ ක්‍රි ව 1815 ආක්‍රමණය

# ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක

- උඩරට ස්වාධීන රාජ්‍යයක් ලෙස පැවතීම මුහුදුබඩ ඉංග්‍රීසි පාලනයට බාධාවක් වීම
- වෙරළබඩ මෙන්ම අභ්‍යන්තර ආරක්ෂාව සඳහා ද හමුදා යෙදවීමෙන් ආරක්ෂක වියදම් වැඩි වීම
- මුහුදුබඩ වැසියන් උඩරට රජු තම රජු ලෙස පිළිගැනීම හා රජු ඉංග්‍රීසීන්ට එරෙහිව කැරළි කරුවන්ට සහාය දීම
- කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිමින් සබඳතා පැවැත්වීම දුෂ්කර වීම
- උඩරට රාජ්‍ය කිසියම් විටක තම සතුරන් වූ ප්‍රංශ ජාතිකයින්ගේ සහාය ලබා ගනීවි යැයි බිය වීම



# ක්‍රි ව 1803 උඩරට ආක්‍රමණය

**ආණ්ඩුකාරවරයා - පෙඩ්රික් නෝර් ත්**

**සටන මෙහෙය වූ සෙන්පති - මැක්ඩෝවෙල් සෙනෙවි**

**සටන අසාර්ථක වීමට හේතු**

- වැසි සමය ආරම්භ වීම
- ඉංග්‍රීසි හමුදා අතර ලෙඩ රෝග පැතිර යාම
- පහතරට සිට උඩරටට තිබූ සැපයුම් මාර්ග අවහිර වීම නිසා ආහාර පාන හිඟ වීම
- පණිවිඩ හුවමාරුව දුෂ්කර වීම
- උඩරටියන් ගේ ගරිල්ලා සටන්ක්‍රම
- උඩරට පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබීම

# 1815 ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණය සාර්ථක වීමට බලපෑ ප්‍රධාන කරුණු

## ක්‍රි ව 1815 උඩරට ආක්‍රමණය

- ඉංග්‍රීසීන්ගේ උපායශීලී ක්‍රියාකලාපය
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියා කලාපය



# ඉංග්‍රීසීන් අනාගත ආක්‍රමණයකට පසුබිම ගොඩනැගීමේ උපායශීලී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම


මෙරටට පැමිණි දෙවන ආණ්ඩුකාරවරයා වූ තෝමස් මෙට්ලන්ඩ් ජෝන් ඩොයිලි නම් සිවිල් සේවකයා යොදා ගනිමින් උඩරට පිළිබඳ තොරතුරු සෙවීම

උඩරට රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳව කිසිදු යුරෝපීයෙකු නොදත් තොරතුරු රැසක් ඩොයිලිට අනාවරණය කරගත හැකි වීම

## ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ගේ පාලන කාලයේ උඩරට රාජ්‍ය පරිහානිය ඉක්මන් කෙරුණු සිදු වීම්

- රජු හා උඩරට රදළ ප්‍රධානීන් අතර පැවති අර්බුද
- රජු හා භික්ෂූණ් වහන්සේලා අතර සබදතා ගීලිහී යාම
- රජු හා මහජනතාව අතර සබදතා බිදවැටීම






# ක්‍රි ව 1815 ඉංග්‍රීසීන් උඩරට අත්පත් කර ගැනීම

ක්‍රි ව 1803 උඩරට ආක්‍රමණයේදී රජු හා උඩරට රාජ්‍ය ආරක්ෂා කළ මිනිස් පවුර ක්‍රි ව 1815 දී රජුට එරෙහි බලවේගයක් බවට පත්වීම නිසා රජු අනාරක්ෂිත වීම

රොබට් බවුන්රිග් උඩරට ආක්‍රමණය කොට උඩරැටියන්ගේද සහාය ලබාගෙන රජු අත් අඩංගුවට ගැනීම

උඩරට රදළ ප්‍රධානීන්ගේ සහාය ලබාගෙන උඩරට ගිවිසුම අත්සන් කිරීම මගින් උඩරට නීත්‍යානුකූල අයිතිය ලබාගැනීම



Proclamation

At a convention held on the 2nd day of March in the year of Christ 1815 and the Cingalese year 1736 at the Palace in the City of Kandy Between His Excellency Lieutenant General Robert Brownrigg Governor and Commander in Chief in and over the British Settlements and Territories in the Island of Ceylon, acting in the name and on behalf of His Majesty George the Third King, and His Royal Highness George Prince of Wales Regent, of the United Kingdom of Great Britain and Ireland on the one part and the Adikars, Dissaves and other Principal Chiefs of the

14

Pilima Talawuwa
1st Adikar & Disave of Saffragam — Signed
Disave of the 4 Korles — Signed
Monarawila
Disave of Uwa — Signed
Ratwatte
Disave of Matale — Signed
Molligoda
Disave of the 3 Korles — Signed
Dulleywe
Disave of Wallapane — Signed
Millawa
Disave of Wellasse and Bintenne — Signed
Galagama
Disave of Tamankada — Signed
Galagoda
Disave of Nuwara Kalawiya — Signed

In Presence of
(Signed) J. D'Oyly
Chief Translator to Govt.
" Ja. Sutherland
Depy. Secy. to Govt.

# උඩරට ගිවිසුම

- 1815 මාර්තු දෙවන දින මහනුවර මගුල් මඩුවේදී ඉංග්‍රීසි ආණ්ඩුව වෙනුවෙන් රොබට් බවුන්රිග් ආණ්ඩුකාරවරයා ද උඩරට වැසියන් වෙනුවෙන් රදළ ප්‍රධානීන් අතර උඩරට රාජධානිය යටත් වීම සම්බන්ධයෙන් ඇති වූ ගිවිසුමයි

**සවියෙන් පෙරට - අපි එකට**

**e – ඉගෙනුම් පාසල**

***හොරණ අධ්‍යාපන කලාපය***

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 1 | **2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය**<br>**1 කොටස- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම**<br><br>**ඇගයීම** |

සැකසුම - **අජිතා පුෂ්පකාන්ති** - ගුරු උපදේශක

**කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - බුලත්සිංහල**

01 ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට බලපෑ ප්‍රධාන සාධක 02 ක් සඳහන් කරන්න

02 උඩරට රාජ්‍ය අතර සබඳතා පැවැත්වූ ඉංග්‍රීසි දූතයන් තිදෙනෙකු නම් කරන්න

03 ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ පාලනය කෙරෙහි මුහුදුබඩ ජනතාව අප්‍රසාදය පළ කිරීමට හේතු වූ කරුණු තුනක් සඳහන් කරන්න

04 ක්‍රි ව 1815 දී උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් වීමට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියා කලාපය හේතු වූ බවට කරුණු තුනක් සඳහන් කරන්න

**සවියෙන් පෙරට - අපි එකට**

**e – ඉගෙනුම් පාසල**

*හොරණ අධ්‍යාපන කලාපය*

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 1 | **2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය**<br>**1 කොටස- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම**<br><br>**පිළිතුරු** |

සැකසුම - **අජිතා පුෂ්පකාන්ති** - ගුරු උපදේශක
**කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - බුලත්සිංහල**

01 ශ්‍රී ලංකාවේ පිහිටීම
ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුළු වටින වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම

02 ජෝන් පයිබස්
හියු බොයිඩ්
රොබට් ඇන්ඩෲස්

03 නව බදු පැනවීම
බදු මුදලින් පමණක් අය කිරීම
බදු එකතු කිරීම සඳහා මදුරාසි අවුමිල්දාර් වරු පත් කිරීම

04 රජු හා ජනතාව අතර පැවති සබඳතා බිඳ වැටීම

රජු හා රදළ ප්‍රධානීන් අතර පැවති මතභේද

රජු හා භික්ෂූන් වහන්සේලා අතර පැවති සබඳතා බිඳ වැටීම

සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

# 2 පාඩම: ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය

# II කොටස-විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්





සැකසුම- කේ.රාජිකා කුමුදුනී

බප/හො/දීපාලෝක මහා විද්‍යාලය

- උඩරටින් විදේශිකයන් නෙරපීමට සහ අහිමි  වු  නිදහස යලි දින ගැනීමට දැරු උත්සහයක් අරගල / සටන් ලෙස හදුන්වා දිය හැක.
- එවැනි නිදහස් සටන් 2ක් ප්‍රබලව හදුනාගත හැක.

1. 1818 නිදහස් සටන
2. 1848 නිදහස් සටන



# 1818 නිදහස් සටන




- 1818 නිදහස් සටනට තුඩු දුන් හේතු

1. නිදහස අහිමි වීම.
2. දැක නොතිබූ අයෙකු රජු ලෙස සැලකීමට සිදුවීම
   [රජකු නැති වීම පිලිබද පසුතැවිල්ල ]
3. බුද්ධාගම ආරක්ෂා කරන බවට දුන් ප්‍රතිඥාව බිඳ දැමීම
4. සංස්කෘතිය ,සම්ප්‍රදාය විනාශ කිරීම
5. සාම්ප්‍රදායක තනතුරු ලාභි රදලයන්ගේ බලය හා සමාජ තත්වයට
   පහර වැදීම

# 1818 නිදහස් සටනට තුඩු දුන් ආසන්නතම හේතුව


- බහුතර සිංහල ජනයා වාසය කල වෙල්ලස්සේ උඩරට ප්‍රවාහන කටයුතු භාරව හජ්ජි මරික්කාර් නැමති මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම නිසා සිංහල ජනයා අතර ඇති වූ විරෝධයයි.

# 1818 සටනේ ස්වභාවය

ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරටියන් තුල පැවති අප්‍රසාදය අතර තුර සිංහාසනයට උරුමයක් ඇතැයි කී දොරේ සාමි නැමැත්තකු වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතුවීමත්,ප්‍රාදේශීය ප්‍රභුවරුන් සහාය ඇතිව රාජ්‍ය උරුමය ලබා ගැනීමේ සංවිධානාත්මක ව්‍යාපාරයක් ආරම්භ වීමත් සිදු විය.

- එම තොරතුරු ලැබුනු බදුල්ල ඒජන්ත ඩග්ලස් විල්සන් දොරේසාමි ඇතුලු පිරිස අත්අඩංගුවට ගැනීමට හජ්ජි මරික්කාර් යෙද වූ අතර ඔහු ගැටුමේදී මිය ගියේය.අනතුරුව ගැටුමෙන් ඒජන්තවරයාද මියයාමත් සමග තත්වය පාලනයට උඩව දිසව භාර කැප්පෙටිපොල යොදවනු ලැබීය






* කැප්පෙටිපොල තමාගේ ඉංග්‍රීසි සේනාව ආපසු යවා තෙමේද සිංහලයන්ට එක්වීම සමග සටන සෙසු ප්‍රදේශ වෙතද ව්‍යාප්ත විය ප්‍රධාන පෙලේ රදලයන් බොහෝමයක් සටනට එකතු විය

* දොරේ සාමි රජු ලෙසත් නව රජුගේ මහාදිකාරම් ලෙස කැප්පෙටිපොල දිසාවේත් පත් කල අතර රාජය සංකේතය වූ දළදාවද සටන්කරුවන් අතට පත් විය

## නිදහස් සටනේ නායකයින්


- කැප්පෙටිපොල දිසාව
- මඩුගල්ලෙ දිසාව
- කිවුලේගෙදර මොහොට්ටාල
- පිලිමතලව්වෙ දෙවන අදිකාරම්
- බූටැඩියෙ රටේරාල




- කොහොකුඹුරේ රටේරාල
- කතරගම බස්නායක නිලමේ
- ගලගෙදර මොහොට්ටාල
- කොබ්බෑකඩුව නිලමේ








## සටනට එකතු නොවූ රදලයින්

- මොල්ලිගොඩ දිසාව
- එක්නැලිගොඩ



## සටන මර්දනය

- 1818 පෙබරවාරි මස උඩරට ප්‍රදේශයට යුද්ධ නීතිය ප්‍රකාශයට පත් කිරීම
- සටන මර්දනයට බිම්පාළු ප්‍රතිපත්තිය අනුගමනය කිරිම
- සටනේ නායකයන් අත් අඩංගුවට ගැනීම
- යුද්ධාධිකරණය මගින් මරණීය දණ්ඩනය රටින් පිටුවහල් කිරීම
- දේපල රාජසන්තක කිරිම වැනි දඩුවම් සටනට සම්බන්ධ අයට ලබා දීම

# 1818 සටන අසාර්ථක වීමට හේතු

- ඉංග්‍රීසීන් අනුගමනය කල දැඩි මර්දනකාරී ප්‍රතිපත්තිය
  [යුද්ධ නීතිය හා බිම්පාළු ප්‍රතිපත්තිය]
- දීර්ඝ කාලීන සටනකට අවශ්‍ය ආයුධ හෝ වෙනත් සම්පත් උඩරැටියන් සතු නොවීම
- සටනේ ප්‍රබල සන්විධානාත්මක බවක් නොතිබීම
- දොරේසාමි නැමැත්තාට රාජ්‍ය උරුමයක් නොමැති බව හෙළිවීම




# 1818 සටනේ ප්‍රතිපල

- රටේ නිදහස වෙනුවෙන් දිවිපිදීමට නිදහස් සටනේ නායකයින්ට සිදුවීම [කැප්පෙටිපොල /මඩුගල්ලේ දිසාව වැනි]
- උඩරට රදලයින්ගේ දේපල රාජසන්තක කිරීම/ සහයදුන් පිරිස් රටින් පිටුවහල් කිරීම / පක්ෂපාති පිරිස් වෙත වරප්‍රසාද ලබාදීම [එක්නැලිගොඩ/ මොල්ලිගොඩ]
- උඩරට බලය ස්ථාවර කරගැනීමට ඉංග්‍රීසි පාලනයට හැකිවීම

  (උඩරට ප්‍රකාශනය මගින්)





# 1848 නිදහස් සටන

## හැදින්වීම

ඉංග්‍රීසි පාලනයට එරෙහිව පැරණි රජාණ්ඩු ක්‍රමය යළි පිහිටුවා ගැනීම සඳහා 1818 න් පසු වසර තිහක් පමන ගතවන විට ඉංග්‍රීසි ආදිපත්‍යයට එරෙහිව ඇති වු ආයුධ සන්නද්ධ දෙවන නිදහස් සටන 1848 නිදහස් සටනයි

## 1848 නිදහස් සටනට තුඩු දුන් හේතු

### 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම්

#### 1.1 රජයේ ඉඩම් ප්‍රතිපත්තිය

1840 පැන වු මුඩුබිම් පනත මගින් වසර 30 ක් බුක්ති විදි බවට පිලිගත හැකි සාක්ෂි නොමැති ඉඩම් රාජසන්තක කිරීම තුල උඩරට ජනතාවගේ පාරපරිකව භුක්ති විදී ඉඩම්වල අයිතිය අහිමවීම හා කෘෂි කාර්මික කටයුතු අඩාල වීම

## 1.2 ගම් සභාව අඩපණ වීම


කෝල්බෲක් ප්‍රතිසංකරණය මගින් අනිවාර්ය සේවා රාජකාරි ශ්‍රම ක්‍රමය අහෝසි කිරිම හා එමගින් ගම් සභාවෙන් සිදු වූ ග්‍රාමීය ජනතාවට අදාල බොහෝ කටයුතු අහෝසි වීම

## 1.3 නව අධිකරණ ක්‍රමය

කැමරන් ඉදිරිපත් කල උඩරට ජනතාවට අත්දැකීම් නැති ඉංග්‍රීසියෙන් කතා කල නීතීඥ ගාස්තු/මුද්දර ගාස්තු ගෙවීමට සිදුවන අධිකරණ ක්‍රමය

## 1.4 රජය හා මහජනතාව අතර සබදතාව දුරස් වීම

පොදු ජනතාවගේ ගැටලු රජයේ අවධානයට යොමු නොවීම හා රාජ්‍ය නිලධාරීන් කෝල්බෲක් නිර්දේශය අනුව වතු වගා කටයුතුවල යෙදීම නිසා



# රජයේ නව බදු ප්‍රතිපත්තිය

2.1 ටොරින්ටන් ආන්ඩුකාරවරයා1848 පැන වූ නව බදු වර්ග රැසක් හේතුවෙන් මහජන අප්‍රසාදයක් හා විරෝධතා පැන නැගිනි

## නව බදු වර්ග

- මුද්දර බද්ද
- කරත්ත හා පාරු බද්ද
- වෙලදසැල් බද්ද
- තුවක්කු බද්ද(වසරකට සිලින් 2 2/1 ගෙවීමටවීම හා ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුනු පෝරම පිරවිමට සිදුවීම)
- ඇග බද්ද
- බලු බද්ද
- පාර බද්ද[පාරවල් තැනීමට වැඩිහිටි පිරිමියෙකු වසරකට දින හයක් නොමිලයේ සේවය කල යුතු වීම නැතහොත් සිලින් 3 ක ඇග බද්දක් ගෙවීමට සිදුවීම ]


2.2 රජයේ නිල්පොත නම් සංඛ්‍යා ලේඛන සංග්‍රහයට තොරතුරු සමීක්ෂණයක් සිදු කිරීම
(තව තවත් බදු පැනවීමක් ලෙස ජනතාව තුල සැකයක් ඇති වීම)



## 1848 සටනේ ආසන්නතම හේතුව

ආණ්ඩුව බදු ප්‍රතිපත්තියට විරෝධතා දැක්වීමට බදුල්ල,මහනුවර, කොලඹ, ගාල්ල නගරවලට රැස් වූ ජනතා උද්ඝෝෂණ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි සටනක් බවට පරිවර්තනය වීම





### 1848 සටනේ නායකයින්

- ගොන්ගාලේගොඩ බන්ඩා හෙවත් පැලියගොඩ ඩේවිඩ්[රජු වශයෙන්]
- පුරන් අප්පු හෙවත් ප්‍රැන්සිස්කෝ
- ඩිංගිරාල
- දිනෙස්



### 1848 නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය-මාතලේ

# 1848 නිදහස් සටනේ ප්‍රතිපල

- යුද්ද නීතිය මගින් මර්දනය මෙහෙයවීම නිසා සටන අසාර්ථක වීම
- සටනේ නායකයින් බොහෝදෙනෙකු අත්අඩංගුවට ගැනීම
- පුරන්අප්පුට, කඩහපොල හිමිට මරණීය දන්ඩණයත් ගොන්ගාලේගොඩ බන්ඩා රටින් පිටුවහල් කිරීමත් ඇතුලු දැඩි දඬුවම් ලැබීම
- ටොරින්ටන් ආන්ඩුකාරවරයා තම රටට කැදවා ගැනීම
- මහජන විරෝධයට තුඩු දුන් බදු අවලංගු කිරීම [වෙලදසැල් බද්ද,බලු බද්ද මුලුමනින්ම හා අනෙක්වාගේ අහිතකර අංග ඉවත් කිරීම]
- බුද්ධාගම සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට කටයුතු කිරීම
- ගොවි ගැටලු විසදීමට අදාල ප්‍රතිපත්තියේ කිසියම් වෙනසක් ඇති කිරීම



# සටන අසාර්ථක වීමට හේතු

- මනාව සංවිධානය වී නොතිබීම
- යුධ පුහුණුවක් හෝ අවශ්‍ය අවි ආයුධ නොතිබීම
- උඩරට ප්‍රදේශ කිහිපයකට පමණක් සටන සීමා වීම
- උඩරට ප්‍රදේශය පිලිබදව ඉංග්‍රීසීහු හොද අවබෝධයක් තිබීම
- ඉංග්‍රීසීහු සතු හමුදා ශක්තිය හා ආයුධ බලය





**සවියෙන් පෙරට - අපි එකට**

**e – ඉගෙනුම් පාසල**

***හොරණ අධ්‍යාපන කලාපය***

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 1 | **2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය**<br>**2 කොටස- විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්**<br><br>**ඇගයීම** |

සැකසුම- කේ.රාජිකා කුමුදුනී
බප/හො/දීපාලෝක මහා විද්‍යාලය

**1 කොටස- 1818 නිදහස් සටන**

1. උඩරට ප්‍රවාහන කටයුතු භාර වූ මඩිහේ මොහන්දිරම් තනතුරට පත්වූ මුස්ලිම් ජාතිකයා කවුරුන්ද?
2. ඉංග්‍රීසි පාලනය කෙරෙහි උඩරට අප්‍රසාදයක් පවතින අතරතුර සිංහාසනයට උරුමයක් ඇතැයි කී වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතු වූ පුද්ගලයා කවුරුන්ද?
3. 1818 නිදහස් සටන මෙහෙයවීම ට ඉදිරිපත් වූ නව රජුගේ මහාධිකාරම් තනතුරට පත්වූ රදළ ප්‍රධානීයා කවුරුන්ද?
4. 1818 නිදහස් සටන මර්දනයට ඉංග්‍රීසීන් යොදා ගත් ක්‍රමවේදය කුමක්ද?
5. 1818 නිදහස් සටනේදී අත්අඩංගුවට පත් සටන් නායකයින් 03 දෙනෙකු නම් කරන්න,
6. ඉංග්‍රීසින්ට පක්ෂපාතී ව කටයුතු කළ රදළ ප්‍රධානීන් 02 නකු නම් කරන්න.
7. 1818 නිදහස් සටනෙ පසු කාලීන ප්‍රතිඵල 03 ක් ලියන්න
8. බ්‍රිතාන්‍ය බලය මෙරට තුළ තහවුරු කළ ප්‍රකාශනය කුමක්ද?

## 2 කොටස- 1848- නිදහස් සටන

1. 1848 නිදහස් සටනට තුඩු දුන් හේතු 04 ක් ලියන්න
2. 1840 පනවන ලද දේශීය ඉඩම් ඉංග්‍රීසි රජයට පවරා ගැනීමට තැනූ පනත කුමක්ද?
3. 1848 නව බදු ප්‍රතිපත්තියක් ඉදිරිපත් කල ආණ්ඩුකාරවරයා කවුරුන්ද?
4. නව බදු වර්ග 05ක් නම් කරන්න
5. පාර බද්ද යනු කුමක්ද?
6. 1848 නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ කොහේද?
7. 1848 සටනේ නායකයින් 03 ක් නම් කරන්න
8. ත්‍රි සිංහලයේ රජු ලෙස දඹුලු රජ මහා විහාරයේදී ඔටුනු පැළදි රජතුමා කවුරුන්ද?
9. 1848 සටන අසාර්ථක වීමට බල පෑ හේතු 03ක් ලියන්න
10. 1848 සටනේ ප්‍රතිපල 04ක් ලියන්න

## සවියෙන් පෙරට - අපි එකට

## e – ඉගෙනුම් පාසල

### *හොරණ අධ්‍යාපන කලාපය*

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 1 | **2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය**<br>**2 කොටස- විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්**<br><br>**පිළිතුරු** |

සැකසුම- කේ.රාජිකා කුමුදුනී
බප/හො/දීපාලෝක මහා විද්‍යාලය

### 1 කොටස- 1818 නිදහස් සටන

1. හජ්ජි මරික්කාර්

2. දොරේසාමි

3.කැප්පෙට්ටිපොල නිලමේ

4. බිම්පාලු ප්‍රතිපත්තිය

5. කැප්පෙට්ටිපොල නිලමේ,ගලගෙදර මොහොට්ටාල,මඩුගල්ලේ නිලමේ,බූටැවේ රටේරාල,කොබ්බැකඩුව

6. මොල්ලිගොඩ දිසාව හා එක්නැලිගොඩ

7. නිදහස් සටනේ නායකයින් අත් අඩංගුවට ගැනීම හා දඩුවම් පැමිනවීම,පක්ෂපාති රදලයින්ට වරප්‍රසාද ලබා දීම,1818 ප්‍රකාශනය මගින් ඉංග්‍රීසි බලය උඩරට තහවුරු කර ගැනීම

8. 1818 උඩරට ප්‍රකාශනය

**2 කොටස- 1848 නිදහස් සටන**

1.

- නිදහස අහිමි වීම හා රජකු නැතිවීම පිලිබඳ පසුතැවිල්ල
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිලිබඳ ගැටළු මතු වීම
- උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම
- බහුතර සිංහල පිරිසක් සිටි වෙල්ලපර ප්‍රදේශයේ මුහන්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් පත් කිරීම
- ගිවිසුම් ප්‍රකාරව ඉංග්‍රීසීන් කටයුතු නොකිරීම

2. මුඩුබිම් පනත

3. ටොරින්ටන්

4.

- මුද්දර බද්ද
- කරත්ත හා පාරු බද්ද
- වෙලදසැල් බද්ද
- තුවක්කු බද්ද(වසරකට සිලින් 2 2/1 ගෙවීමටවීම හා ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුනු පෝරම පිරවීමට සිදුවීම)
- ඇග බද්ද
- බලු බද්ද

5. පාර බද්ද [පාරවල් තැනීමට වැඩිහිටි පිරිමියෙකු වසරකට දින හයක් නොමිලයේ සේවය කල යුතු වීම නැතහොත් සිලින් 3 ක ඇග බද්දක් ගෙවීමට සිදුවීම]

6.මාතලේ

7.

- ගොන්ගාලේගොඩ බන්ඩා හෙවත් පැලියගොඩ ඩේවිඩ්
- පුරන් අප්පු හෙවත් ප්‍රැන්සිස්කෝ
- ඩිංගිරාල
- දිනෙස්

8. ගොන්ගාලේගොඩ බන්ඩා හෙවත් පැලියගොඩ ඩේවිඩ්

9.

- මනාව සංවිධානය වී නොතිබීම
- යුධ පුහුණුවක් හෝ අවශ්‍ය අවි ආයුධ නොතිබීම
- උඩරට ප්‍රදේශ කිහිපයකට පමණක් සටන සීමා වීම
- උඩරට ප්‍රදේශය පිලිබඳව ඉංග්‍රීසීහු හොඳ අවබෝධයක් තිබීම
- ඉංග්‍රීසීහු සතු හමුදා ශක්තිය හා ආයුධ බලය

10.

- යුද්ධ නීතිය මගින් මර්දනය මෙහෙයවීම නිසා සටන අසාර්ථක වීම
- සටනේ නායකයින් බොහෝදෙනෙකු අත්අඩංගුවට ගැනීම
- පුරන්අප්පුට, කඩහපොල හිමිට මරණීය දන්ඩණයත් ගොන්ගාලේගොඩ බන්ඩා රටින් පිටුවහල් කිරීමත් ඇතුලු දැඩි දඬුවම් ලැබීම
- ටොරින්ටන් ආන්ඩුකාරවරයා තම රටට කැඳවා ගැනීම
- මහජන විරෝදයට තුඩු දුන් බදු අවලංගු කිරීම [වෙලදසැල් බද්ද,බලු බද්ද මුලුමනින්ම හා අනෙක්වායේ අහිතකර අංග ඉවත් කිරීම]
- බුද්ධාගම සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට කටයුතු කිරීම
- ගොවි ගැටලු විසඳීමට අදාල ප්‍රතිපත්තියේ කිසියම් වෙනසක් ඇති කිරීම